# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/31 - 2022 ඔක්තෝබර් මස 11 වැනි අඟහරුවාදා - 2022.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/78 (XV) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්ති සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වන ලද 1984 ජනවාරි මස 24 වැනි දින අංක 281/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළකරන ලද නියමයේ උපලේඛනය, එහි I වන තීරයේ දැක්වෙන “කෘෂිකර්ම පීඨය” යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන “2. කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය” යන අයිතමය වෙනුවට (2008 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 1567/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින්, සංශෝධනය කරනු ලැබේ :-

“2. කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර අධ්‍යයන අංශය”.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0089